## පෑලියගොඩ නගර සභාව
## ගම්පහ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පෑලියගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 17 ක් වෙනුවෙන් ලැබිය යුතු ආධාර වල වටිනාකම වූ රු.1,401,578 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ආරක්ෂක සේවයට ගෙවිය යුතු මුදල රු.126,207 ක් වුවද ආදායම් වියදම් ගිණුමට හා ණයහිමි ගිණුමට රු.1,236,207 ක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වියදම් හා බැරකම් රු1,110,000 කින් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට රු 288,697 ක වටිනාකමකින් යුත් උපචිත ප්‍රාග්ධන වැයක් ගිණුම් ගතකර නොතිබූ හෙයින් එම වටිනාකමින් ප්‍රාග්ධන වැය හා ණයහිමියන් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ලබා දී තිබූ අත්තිකාරමක් පියවීමේදී වියදම් නොවූ රු19,260 ක ඉතිරි මුදල සමුච්චිත අරමුදලට බැරකර තිබීමෙන් එම වටිනාකමින් සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 220,891 ක ඉන්ධන වියදම ණය හිමියන් ලෙස හා ඉන්ධන වියදම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ජෙනරේටර් මිලදී ගැනීම සඳහා දරන ලද රු 3,982,027 ක් ප්‍රාග්ධන වැයක් ලෙස ගිණුම් ගත නොකර වර්ෂයේ පුනරාවර්තන වැයක් ලෙස ගිණුම් ගත කර තිබූ මෙම වත්කම ප්‍රාග්ධනිත කිරීමද සිදුකර නොතිබුණි.

(උ) 2017 දෙසැම්බර් 31 දිනට මිලදී ගෙන තිබූ රු 26,795 ක් වූ භාණ්ඩ ගබඩා ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

----------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කල ගිණුම හා ලේඛන/උපලේඛන අතර විෂයයන් 05 ක වෙනස්කම්වල එකතුව රු.588,656 ක් විය.

(ආ) ගබඩා ලැබීම් පත්‍ර අනුව සමාලෝචිත වර්ෂය තුල රු. 4,106,319 ක භාණ්ඩ ලැබී තිබුණද ගබඩා තොග ගිණුම අනුව එය රු. 3,112,365 ක් වූයෙන් රු. 993,954 ක වෙනසක් පැවතුණු අතර, ගබඩා නිකුත් කිරීම් පත්‍ර අනුව සමාලෝචිත වර්ෂය තුල රු 2,142,493 ක භාණ්ඩ ගබඩාවෙන් නිකුත්වී තිබුණද, ගිණුම අනුව එය රු 3,956,516 ක් වූයෙන් රු 1,814,023 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

ලැබිය යුතු ගිණුම්

-------------------

(i) 2014 වර්ෂයේ සිට පැවත එන රු.3,966,656 ක ලැබිය යුතු ආධාර නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට අගරු චෙක්පත් ගිණුමෙහි වූ රු 192,715 ක අයවිය යුතු වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කර වර්ෂ 02 ඉක්මවා තිබූ, රු 123,345 ක් වූ රැඳවුම් මුදල් හා රු. 55,280 ක් වූ ටෙන්ඩර් ඇප තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.12,932,516 ක් වූ අතර ,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,996,351 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` |
| (i) | වරිපනම් හා බදු | 40,500 | 41,450 | 42,792 | 26,754 | 40,000 | 40.197 | 44,023 | 28,096 |
| (ii) | කුලී | 3,499 | 3,229 | 3,264 | 103 | 2,424 | 1,250 | 2,285 | 139 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,127 | 1.990 | 1,990 | - | 1,522 | 2.308 | 1,284 | - |
| (iv) | වෙනත් ආදායම් | 19,480 | 6,353 | 6,353 | - | 17,899 | 15,604 | 15,603 | - |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉකුත් වර්ෂයේ වරිපනම් හා බදු හිඟ ආදායම වූ රු.28.095,593 කින් සමාලෝචිත වර්ෂයේ රු.7,954,586 ක් පමණක් අය කර තිබූ හෙයින් එම අය කිරීම සියයට 28 ක් වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ කුලී හිඟ ආදායම වූ රු.138,910 කින් සමාලෝචිත වර්ෂයේ අය කර තිබූ මුදල රු.60,077 ක් පමණක් වූ හෙයින් හිඟයෙන් අය කිරීම සියයට 43 ක් වී තිබුණි.

(ඇ) වෙනත් ආදායම් සඳහා බිල් කළ මුදල රු. 6.352,773 ක් වූ අතර ඇස්තමේන්තු කල මුදල රු.19,480,000 ක් වී තිබූ හෙයින් ඇස්තමේන්තු කිරීම තාත්වික ආකාරයෙන් සිදු කර නොතිබුණි.

### 2.2.3 බලපත්‍ර ගස්තු

(අ) නාගරික බල ප්‍රදේශයේ සංචාරක පනත යටතේ ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි තානායම් 02 කින් අයකර තිබූ රු.137,959 ක බලපත්‍ර ගාස්තු සඳහා පසුගිය වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම් කරගත් මුළු පිරිවැටුම මත සියයට 01 නොඉක්මවන ගාස්තුවක් හඳුනා ගෙන අය කරගෙන නොතිබුණි.

(ආ) කාලානුරූපීව බලපත්‍ර ගාස්තු, කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු සංශෝධනය කර සභාවේ ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, නගර සභා පනත මගින් 1988 දී පනවා තිබූ බලපත්‍ර, ව්‍යාපාර හා කර්මාන්ත බදු ගාස්තු කිසිදු සංශෝධනයකින් තොරව එලෙසින්ම සමාලෝචිත වර්ෂය සඳහාද අයකර තිබුණි.

### 2.2.4 මුද්දර ගාස්තු

2015, 2016 හා 2017 යන වර්ෂ සඳහා එක් එක් වසර වෙනුවෙන් මුද්දර ගාස්තු ආදායම රු. 10,000,000 බැගින් අයවැය ලේඛනවල සඳහන් කර තිබුණද එකී ආදායම් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

-------------------

සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති ඉටු නොකිරීම

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභා අරමුදල් මගින් ප්‍රතිපාදිත රු.5,780,382 ක ව්‍යාපෘති 07 ක් සඳහා ඇස්තමේන්තු පිළියෙල කර ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණද ඒවා නිම කර නොතිබුණි.

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

-----------------------------------

පෙරටු කාර්යාලයක් ඉදිකිරීම සඳහා 2017 නොවැම්බර් 01 දින රු. 222,120 ක් වැයකර උපකරණ මිලදී ගෙන තිබුණද 2018 මැයි 14 දින වන තෙක් පෙරටු කාර්යාලයක් ආරම්භ කර නොතිබුණි.

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

(i) වෙන්කරන ලද දිරාපත්වන කසළ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ දික්ඕවිට ජීව වායු අංගනය වෙත ටොන් 01ක් රු.592 බැගින් 2017 මාර්තු 17 සිට 2018 මාර්තු 16 දින දක්වා බැහැර කිරීම සඳහා නගර සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එහෙත් වෙන්කල කසළ ටොන් එකක් රු.3,000 බැගින් කසළ ටොන් 76.18 ක් හා වෙන් නොකල මිශ්‍ර කසළ ටොන් එකක් රු.5,000 බැගින් කසළ ටොන් 115.5 ක් මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ කෙරවලපිටිය කසල අංගනය වෙත බැහැර කර තිබූ අතර ඒ සඳහා රු.1,198,875 ක් ගෙවීම් කිරීමට නිර්දේශ කර තිබුණි.

(ii) වෙන් කරන ලද දිරන අපද්‍රව්‍ය සම්පූර්ණ ප්‍රමාණයම කොම්පෝස්ට්කරණයට ලක්කිරීමට දික්ඕවිට ව්‍යාපෘතියේ ධාරිතාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පැලියගොඩ දුටුගැමුණු මාවතේ,කොළඹ කටුනායක අධිවේගී මාර්ගයට ආසන්නයේ අක්කර 02 ක් පමණ විශාලවූ නාගරික සංවර්ධන අධිකාරියට අයත් වගුරු සහිත ඉඩමක අවිධිමත් ලෙස පරිසරය දූෂණය වන පරිදි විවෘත භූමියේ කසළ බැහැරලීම සිදු කර තිබූ අතර එමඟින් ප්‍රශ්න රැසකට මුහුණපා තිබුණි. ඒ අනුව කසළ බැහැර කිරීමේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කර ගෙන නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

---------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන්වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ සභාව විසින් දැනුවත්වීමක් සිදුව නොතිබුණි.

3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

(අ) සභාව සතු කැබ් රථ 02 ක හා බැකෝ යන්ත්‍රයක යතුරු අස්ථානගත වීම සම්බන්ධයෙන් පත්කර තිබූ විනය පරීක්ෂණ කමිටුව විසින් ආරක්ෂක සේවය ඒ සඳහා වගකිය යුතු බවත්, වාහන තුනේ යතුරු පද්ධති සම්පූර්ණයෙන්ම වෙනස් කර අලුත් යතුරු පද්ධතියක් සවිකිරීමට යන වියදම ආරක්ෂක

සේවා (පුද්) සමාගමෙන් අයකරගැනීම සුදුසු බවත්, 2017 අගෝස්තු 10 දිනැති වාර්තාවෙන් තීරණය කර තිබුණද 2017 දෙසැම්බර් 07 දින වනවිටත් යතුරු පද්ධතිය වෙනස් කිරීමට හා අදාල පාඩුව ආරක්ෂක සේවා (පුද්) සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉහල පොලී අනුපාතික සහිත ආයෝජන මාර්ගයක යෙදවීමකින් තොරව, 2017 දෙසැම්බර් 31 දිනට රු 620,722 ක වටිනාකමක් ඉතිරි කිරීමේ ගිණුමක රදවාගෙන තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

(අ) විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ඕලු පොකුණ වත්ත lll වන පටුමහ ගල් අතුරා කොන්ක්‍රීට් කිරීම සඳහා රු.249,922 ක වියදමක් දරා තිබුණි. මෙම මාර්ගය සභාවට අයත් නොවන නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් තුල පිහිටි අනවසර ඉදි කිරීම් පවත්නා තාවකාලික නිවාස සංකීර්ණයක් තුල පිහිටි මාර්ගයක් විය.

(ආ) නගර මධ්‍යයේ වූ වරිපනම් අංක 114 දරන නගර සභාව සතු දේපලේ වාර්ෂික බදු කාලය 2016 ජූලි 28 දින අවසන් වී තිබූ හෙයින් ඉදිරි සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් නැවත සභාවට පවරා ගැනීමට 2016 සැප්තැම්බර් 02 දින මුදල් කමිටුව තීරණය කර තිබුණි. එහෙත් බදුකරු විසින් අනුමැතියකින් තොරව 2017 දෙසැම්බර් 13 දින දක්වාම ඉදිකිරීමක්ද සහිතව ව්‍යාපාරික කටයුතු පවත්වා ගනිමින් තිබූ අතර ඉහළ ආර්ථික වටිනාකමකින් යුතු මෙම ඉඩම නැවත සභාවට පවරා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) ඉතා ජනාකීරණ හා ඉහළ ආර්ථික වටිනාකමක් සහිත පැලියගොඩ නාගරික ප්‍රදේශයේ පිහිටි සභාව සතු කඩකාමර 28 ක් සඳහා 1986 දෙසැම්බර් 31 දිනැති අංක 46 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව වර්ෂ 25 කටත් අධික කාලයක සිට ගිවිස තිබූ ඉතා අඩු මාසික කුලියක් අය කර තිබුණි.2018 අප්‍රේල් 25 දින අංක යූ.සී.පී.ඊ/03/01/කඩකුලී/2017/01 දරන තක්සේරු දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් කඩ කුලී සංශෝධනය කර තිබුණද එම තක්සේරුව අනුව කුලී අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

----------------------------

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

------------------------------

සභාව සතු බවට අයවැය ලේඛනයෙන් සනාථ වූ වාහන අයිතම 12 කට අදාලව සමීක්ෂණයන් සිදුකොට ඒවායේ භෞතික පැවැත්ම තහවුරු කර ගෙන නොතිබුණි.

(ආ) නිරවුල් කර නොගත් සභා දේපල

-----------------------------------

ස්ථාවර වත්කම් ලේඛනය අනුව සභාව සතු බවට හඳුනා ගෙන තිබූ ඉඩම් දේපල අයිතම 76 ක් සඳහා ඉඩම් ඔප්පු මගින් අයිතිය තහවුරු කරගෙන නොතිබුණි.

3.4.1 වාහන උපයොජනය

---------------------

(i) 2004 වර්ෂයේ සිට සභාව සතු අබලි වාහන ලෙස හඳුනාගෙන තිබූ ට්‍රැක්ටර් ටේලර් 05 ක් හා එන්ජින් 02 ක්, ත්‍රී රෝද රථ 01 ක් හා ගල්රෝල් 01 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 06 දින විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් මගින් අපහරණය කලයුතු බවට තීරණය කර තිබූ, වාහන අයිතම 11 ක් සම්බන්ධයෙන් ඒවායේ වටිනාකම් තක්සේරු කර අපහරණ කටයුතු සිදු කර නොතිබුණි.

3.5 ප්‍රසම්පාදනය
-------------
කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

පැලියගොඩ නගර සභාවට අයත් 90 වත්ත වැසිකිළි පද්ධතිය සංවර්ධනය කිරීමේ ඇස්තමේන්තුවේ වැඩ අංක D හි Septic Tank වැඩ විෂයෙහි පිරිවැය විග්‍රහ කිරීමකින් තොරව රු. 600,000 ක වියදමක් ඇස්තමේන්තු කර තිබූ නමුත්, ඒ සඳහා දරා තිබූ තථ්‍ය වියදම රු. 241,850 ක් වූයෙන් ඇස්තමේන්තු සකස් කිරීමේදී, තාත්වික පදනමින් බැහැරව ඇති බව නිරීක්ෂණය විය. නගර සභාව සතුව ගලි බවුසර් සේවාවක් පවතිද්දී, අවසන් ගෙවීම් වාර්තාවේ , වැඩ අංක F3 හි වැසිකිළි පද්ධතියේ මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩ විෂයය සඳහා රු. 11,000 ක ඵලදායී නොවන වියදමක් දරා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය
-------------------------------------
4.1 අයවැය පාලනය
-----------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ප්‍රතිපාදන සාරාංශය අනුව වැය විෂයයන් 09 ක් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනය රු.1,000 ක් බැගින් වූයෙන් අයවැයගත ප්‍රතිපාදනය තාත්වික ආකාරයෙන් සිදු කර නොතිබූ අතර ඒ අනුව ප්‍රතිපාදන ඇති කිරීමේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
---------------------

අභ්‍යන්තර විගණනයක් සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

5. පද්ධති හා පාලන
--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අය කිරීම දුර්වල තත්ත්වයක පැවතීම. |
| (ආ) | ගිණුම්කරණය | නොසැසඳීම් හා ගිණුම්ගත නොකිරීම් පැවතීම. |
| (ඇ) | වත්කම් පාලනය | අයිතිය තහවුරු කර නොගැනීම හා සමීක්ෂණ නොපැවැත්වීම. |